# PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.

சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS


2020-07-03

## මැතිවරණ ප්‍රචාරක කටයුතු සදහා ආගමික ස්ථාන භාවිතයට ගැනීමෙන් වළකින ලෙස ගෞරවයෙන් කරනු ලබන ඉල්ලීමයි

1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 79(2) අනුව ආගමික ස්ථානවල මැතිවරණ ප්‍රචාරණ කටයුතු සිදුකිරීම මැතිවරණ දූෂණය නැමති වරදට ඇතුළත් වේ.

ආගමික රැස්වීමකදී යම් අපේක්ෂකයතුට ඡන්දය දීමට හෝ නොදීම සදහා පෙළඹවීම, එකී කාර්යයන් සදහා ආගමික රැස්වීමකදී ප්‍රචාරක පත්‍රිකා, ඡායාරූප ආදිය බෙදාහැරීම මෙන්ම යම් අපේක්ෂකයකු ප්‍රවර්ධනය හෝ යම් අපේක්ෂකයකු අගතියට පත් කිරීම පිණිස පූජනීය ස්ථානයක මහජන රැස්වීමක් සංවිධානය කිරීම  මගින් මැතිවරණ දූෂණ ක්‍රියා යටතේ වන **අයුතු බලපෑම** නමැති වරදට වරදකරු වන බව පනතේ 79(2) වගන්තිය දක්වයි.

මෙම ක්‍රියාවක් සිදුකරන  පුද්ගලයකු මහාධිකරණයක් ඉදිරියේ පවත්වන නඩු විභාගයකදී වරදකරු වුවහොත් රුපියල් පන්සියයක දඩයක් හෝ  මාස 6ක සිරදඩුවමක් හෝ එම දඩුවම් දෙකම පැනවිය හැකි අතර එයට අමතරව වසර 7ක් දක්වා කාලයකට මැතිවරණයකට ඉදිරිපත් වීමට හෝ ඡන්දය ප්‍රකාශ කිරීමට නුසුදුස්සෙකු වන බව පනතේ 81 වන වගන්තිය දක්වයි.

පනතේ මෙම ප්‍රතිපාදන අවධාරණය කරමින් මැතිවරණ කොමිෂන් සභාව 2020 ජූනි 29 දින අංක EC/E/DR/PE/2020/4 දරණ ලිපිය මගින් සියලුම පිළිගත් පක්ෂ ලේකම්වරුන්ට සහ ස්වාධීන කණ්ඩායම්වල නායකයන්ට මේ වන විටත් දැනුම් දී තිබේ.

මැතිවරණයේ නිදහස සහ සාධාරණත්වය සදහා මැතිවරණ නීතිවලට අවනත වීමේ වැදගත් කම අවධාරණය කරන අප සංවිධානය සියලුම ආගමික නායකයින් සහ ආගමික ස්ථාන භාර පූජ්‍ය/පූජක උතුමන්ගෙන් ඉල්ලා සිටින්නේ මැතිවරණ ප්‍රචාරක කටයුතු සදහා තම පූජනීය ස්ථාන භාවිතා කිරීමෙන් හෝ භාවිත කිරීමට ඉඩ ලබාදීමෙන් වැළකී මැතිවරණයේ සුපිළිපන්න බව සඳහා දායකවන ලෙසයි.

විධායක අධ්‍යක්ෂක
පැෆ්රල් සංවිධානය